# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.30 පැය 0815 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 174/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයකට තැත් කිරීමක් - කොස්ගොඩ පොලිස් වසම.**

2025.01.30 වන අද දින අළුයම් කාලයේ කොස්ගොඩ පොලිස් වසමේ මහඉඳුරුව ප්‍රදේශයේදී, යතුරු පැදියකින් පැමිණි පුද්ගලයින් දෙදෙනෙකු විසින් නිවසක් ඉදිරිපිටදී හා නිවස තුලට පැමිණ නිවසේ සිටි පුද්ගලයෙකු ඉලක්ක කර ගිනි අවියකින් වෙඩි තැබීමට උත්සාහ කර ඇති බවට කොස්ගොඩ පොලිස් ස්ථානය වෙත 119 මධ්‍යස්ථානයෙන් ලද පැමිණිල්ලකට අනුව විමශර්න ආරම්භ කර ඇත.

වෙඩි තැබීම සඳහා යොදා ගන්නා ලද ගිනි අවිය ක්‍රියාත්මක නොවීමෙන් ජීවිත හා දේපල හානි කිසිවක් සිදුව නොමැත. නිවස ආසන්න ප්‍රදේශයේ තිබී අපරාධය සඳහා යොදාගන්නා ලද ගිනි අවිය බවට සැක කෙරෙන පිස්තෝල වගර්යේ ගිනි අවියක් හමුවී ඇති අතර, වෙඩි තැබීමට හේතුව මෙතෙක් අනාවරණය වි නොමැත.

සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා කොස්ගොඩ පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**